දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) 2013 පරීක්ෂණය - 2015 මැයි/ජූනි
First Examination in Arts (External) 2013 – May/June 2015

දේවිප්‍ර 1.2 - ක්‍රි.ව. 1832 සිට ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමය හා දේශපාලනය
PS 1.2 – Government and Politics of Sri Lanka Since 1832

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
අපහැදිලි අත්අකුරුවලට ලකුණු අඩුවිය හැකිය.

---

01. "1832 කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ ලංකාවේ ආර්ථික, සමාජ සහ දේශපාලන පරිවර්තනයකට මුල පුරන ලදී." අගයන්න.

02. "ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරය නිරූපනය කළේ මධ්‍ය පන්තියේ ආශාවන් සාක්ෂාත් කර ගැනීමට දරූ උත්සාහයකි." විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

03. ශ්‍රී ලංකාවේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කොට, පවත්වාගෙන යාමට අවශ්‍ය ව්‍යුහාත්මක පදනම දැමීමට තුඩු දුන් ඩොනමෝර් යෝජනා කිහිපයක් විය. විභාග කරන්න.

04. "1948 සෝල්බරි ආණ්ඩුක්‍රමය මගින් සුළු ජාතීන්ට විශේෂ නියෝජනයක් හිමිකර දී තිබුණි." එම විධිවාධාන හා ඒවායේ ප්‍රායෝගිකභාවය පරීක්ෂා කරන්න.

05. "ශ්‍රී ලංකාවේ 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව මගින් ගොඩනගන ලද වැදගත්ම ආයතනය ජාතික රාජ්‍ය සභාව විය." විමසන්න.

06. "1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව මගින් හඳුන්වාදුන් සමානුපාතික නියෝජන ක්‍රමය අඩුපාඩුවලින් ගහනය." සාකච්ඡා කරන්න.

07. ශ්‍රී ලංකාවේ ජනවාර්ගික පිළිබිඹුවක් සහිත ජාතික ප්‍රශ්නය විසඳාගැනීම සඳහා යොදා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව විමසීමක් කරන්න.

08. ශ්‍රී ලංකාවේ වාමාංශික ව්‍යාපාරයේ කාර්යභාරය ඔබ පැහැදිලි කරන්නේ කෙසේ ද?

09. ශ්‍රී ලංකාවේ ලියාපදිංචි දේශපාලන පක්ෂ සංඛ්‍යාව 60 (හැටක්) පමණ වුවද, දේශපාලන ක්‍රමයට බලපෑම් සහිත දේශපාලන පක්ෂ සංඛ්‍යාව ඉතාම සීමිත වේ.'' විභාග කරන්න.

10. පහත සඳහන් මාතෘකා දෙකක් (02) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. වත්මන් ආණ්ඩුවේ විදේශ ප්‍රතිපත්තිය.

ii. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය.

iii. 1978 ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් හා ඒවායේ ප්‍රායෝගිකත්වය.

iv. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවල වර්තමාන ක්‍රියාකාරීත්වය.

v. වත්මන් සුළුතර ආණ්ඩු හා එහි භූමිකාව.